ඔබ අතරින් කිසිවෙකු සමීප මිතුරෙකු වීමෙන් අල්ලාහ් වෙත මම නිදොස් වූයෙමි. හේතුව සැබැවින්ම උත්තරීතර අල්ලාහ් ඉබ්රාහීම් (අලයිහිස් සලාම්) තුමාව සමීප මිතුරෙකු ලෙස තෝරාගත් සේම මාව ද සමීප මිතුරෙකු බවට ඔහු තෝරා ගෙන ඇත

ජුන්දුබ් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මරණයට පත්වීමට දින පහකට පෙර කළ ප්රකාශයකට මම සවන් දුන්නෙමි. එතුමාණෝ මෙසේ පවසා සිටියහ: "ඔබ අතරින් කිසිවෙකු සමීප මිතුරෙකු වීමෙන් අල්ලාහ් වෙත මම නිදොස් වූයෙමි. හේතුව සැබැවින්ම උත්තරීතර අල්ලාහ් ඉබ්රාහීම් (අලයිහිස් සලාම්) තුමාව සමීප මිතුරෙකු ලෙස තෝරාගත් සේම මාව ද සමීප මිතුරෙකු බවට ඔහු තෝරා ගෙන ඇත. මාගේ සමූහයා අතරින් මා සමීප මිතුරෙකු තෝරා ගන්නේ නම්, අබූ බක්ර් තුමාව මා සමීප මිතුරෙකු ලෙස තෝරා ගන්නට තිබුණි. දැනගන්න. නුඹලාට පෙර සිටියවුන් ඔවුන්ගේ නබිවරුන්ගේ හා ඔවුන්ගේ දැහැමියන්ගේ මිනීවලවල් දේවස්ථාන බවට පත් කර ගනිමින් සිටියෝය. දැනගන්න! නුඹලා මිනිවලවල් දේවස්ථාන බට පත් කර නොගන්න. සැබැවින්ම මම
නුඹලා එයින් වළක්වමි.
[صحيح] [رواه مسلم]

උත්තරීතර අල්ලාහ් අබියස තම නිලය පිළිබඳ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. ඉබ්රාහීම් (අලෙයිහිස් සලාම්) තුමා ලබා ගත් පරිදි සැබැවින්ම ආදරයේ උසස්ම නිලය එතුමාණන් ලඟා කර ගැනීමය. එබැවින් අල්ලාහ් හැර වෙනත් සමීප මිතුරෙකු එතුමාණන්ට නොවීය. හේතුව සැබැවින්ම එතුමාණන්ගේ හදවත උත්තරීතර අල්ලාහ්ගේ ආදරයෙන්, ඔහුගේ ගරුබුහුමන් බවින් හා ඔහු හඳුනාගැනීමෙන් පිරී පැවතිනි. එබැවින් අල්ලාහ් හැර වෙනත් කිසිවකුට එය ව්යාප්ත නොවීය. එසේ මිනිසුන් අතරින් කිසිවකු හෝ එතුමාණන්ගේ සමීප මිතුරෙකු වී නම්, ඔහු අබූ බක්ර් අස්-සිද්දීක් තුමා වන්නට තිබුණි. පසු ව යුදෙව්වන් හා කිතුනුවන් ඔවුන්ගේ නබිවරුන්ගේ හා දැහැමියන්ගේ මිනීවලවල් සම්බන්ධයෙන්, අල්ලාහ් හැර දමා ඔවුන් ඒවා නමදින හවුල් දෙවිවරුන් බවට පත් කර ගනිමින් ඔවුන්ගේ මිනීවලවල් දේවස්ථාන බවටත් නැමදුම් ස්ථාන බවටත් පත් කර ගනිමින් ඔවුන් කටයුතු කළාක් මෙන් තමන්ට ආදරය කිරීමේ දී අනුමත සීමාව ඉක්මවා යෑම ගැන අවවාද කළහ. ඔවුන් සිදු කළ ක්රියාවන් මෙන් කටයුතු කිරීම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ තම සමූහයාට තහනම් කළහ.

http://sunnah.global/hadeeth/si/show/3347